ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 - 12 - 21 |

පැමිණිලි පාර්ශවය : කේ.ජී.ටී.බී.දිල්හාන් මහතා,
අංක. 103/128, ධර්මරාජ මාවත,
මහනුවර.

වගඋත්තර පාර්ශවය : 1. විදුහල්පති,
මහ/ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

පැමිණිලි අංකය : HRC/KND/157/22/A

**පැමිණිලි පාර්ශවයේ සැළකිරීම :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2022 වර්ෂයේ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ පළමු වසර සඳහා තම දරුවා ඇතුළත් කිරීමට අදාළව "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ" අයදුම්පතක් යොමු කළ බවත්, ඒ අනුව RS-46 යටතේ 2021.11.05 වන දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී තමා ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා නිසිලෙස ලකුණු ලබානොදීමත්, එම විද්‍යාලයේ අභියාචනා මණ්ඩලය වෙතද ඉදිරිපත් වීමෙන් පසු ඒ තුළින්ද තමාට සාධාරණයක් ඉටු නොවුනු බැවින් තමාගේ මානව හිමිකම් කඩවීමක් සිදුකර ඇති බවත්ය. තමා විසින් ඉදිරිපත් කරන ලද පදිංචිය සනාථ කිරීමේ ප්‍රධාන ලේඛනය වන තමාගේ මිත්තණියගේ සින්නක්කර ඔප්පුව හා තමාගේ පියා නමින් වසර 10 ඉක්මවා නොමැති ප්‍රකාශන ඔප්පුව සඳහා ලකුණු ලබානොදුන් බවත්, තමා මෙම ඉඩමේ අඛණ්ඩව ස්ථිරව පදිංචිව ඇති බවත්, එය සනාථ කිරීම සඳහා අතිරේක ලේඛන යටතේ ජල, විදුලි,



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. සභාපති / தவிசாளர் 011-2505451 ෆැක්ස් / தொலைநகல் 011-2505541/74 ඊමේල් / மின்னஞ்சல் sechrcsl@gmail.com

හැඳුනුම්පත්, ඡන්ද නාමලේඛනය වැනි ලේඛන ඉදිරිපත් කළද ඒවාට ලකුණු ලබානොදීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය කටයුතු කර ඇති බවත්, ඒ අනුව තමාට අවම වශයෙන් ලකුණු 81.5 ක් හෝ හිමිවිය යුතු බවට විශ්වාස කරන බවත් දක්වා ඇත. කිසිදු සාවද්‍ය ලේඛනයක් ඉදිරිපත් කර නොමැතිව පරම්පරාගතව අඛණ්ඩව ස්ථිර පදිංචිව සිට පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්කළ තමාට කිසිදු ලකුණක් ලබානොදී අයදුම්පත ප්‍රතික්ෂේප කිරීම තුළින් බලවත් අසාධාරණයක් සිදුකර ඇති බැවින් තමාගේ දරුවා ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කිරීමට සුදුසුකම් ලබන බැවින් ඊට අදාළව ඉදිරි පරීක්ෂණ කටයුතු සිදුකර තම දරුවා අදාළ පාසල වෙත ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරදෙන ලෙසත් පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් :-**

පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවය වාර්තාවක් යොමු කරමින් දන්වා ඇත්තේ, 2021/13 චක්‍රලේඛනයට අනුව එහි 6.1 (ආ) කොටසෙහි සඳහන් පරිදි "සින්නක්කර ඔප්පු හා තෑගි ඔප්පු ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10 හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතුය." යන වගන්තිය අනුව අයදුම්කරුගේ ප්‍රධානතම ලියවිල්ල වූ ප්‍රකාශන ඔප්පුව ලියාපදිංචි වී ඇති කාලය වසර 02ක් බැවින් එම ප්‍රකාශන ඔප්පුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කළ බවයි.

අයදුම්කරුගේ පියාගේ නමට පවතින වසර 10ක් නොඉක්මවන ප්‍රකාශන ඔප්පුව පෙර ඉදිරිපත් කර ඇති සින්නක්කර ඔප්පුවේ අයිතිය අයදුම්කරුගේ මිත්තණියට ඇති බැවින් හා එම මිත්තණියගේ ඔප්පුවේ අයිතිය අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ මවට හෝ පියාට නොපවතින බැවින්, එයද අදාළ චක්‍රලේඛනය අනුව ප්‍රතික්ෂේප කළ බවත්,

අයදුම්කරු ප්‍රධානතම ලේඛනය ලෙස පියාගේ නමට පවතින වසර 10ක නොඉක්මවන ප්‍රකාශන ඔප්පුව ඉදිරිපත් කළ බැවින් 6.11.2 (ඉ) හා (ඊ) කොටස් සඳහා චක්‍රලේඛනයට අදාළව ලකුණු ලබාදිය නොහැකි බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කළ බවත්, දක්වා ඇත.

ඒ අනුව ආර්එස්- 46 යටතේ ඉදිරිපත් වූ මෙම පැමිණිලිකාර කේ.ජී.ටී.බී.දිල්හාන් මහතාගේ දරුවා මෙම විද්‍යාලයේ පළමු වසර සඳහා ඇතුළත් කිරීමට අදාළව යොමු කරන ලද අයදුම්පත 13/2021 චක්‍ර ලේඛනයේ 6.1 ආ උපලේඛනයේ සඳහන් කරුණු අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කළ බවත්, ඊට අදාළව පැවති අභියාචනා හා විරෝධතා මණ්ඩලය මගින්ද ඉහත කරුණු සනාථ කරගැනීමෙන් පසු අදාළ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කල බවත් දක්වා ඇත.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු 2022 වර්ෂයේ පළමු වසර සඳහා මහනුවර ධර්මරාජ විද්‍යාලයට තම දරුවා ඇතුළත් කර ගැනීම සඳහා ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්කර සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිට ඇත අතර, පදිංචි ස්ථානයේ හිමිකම් තහවුරු කිරීම සඳහා පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති තම පියාට අයත් ප්‍රකාශන ඔප්පුව ලියාපදිංචි කර වසර 10ක් නොමැතිවීම නිසා එයට හිමි ලකුණු 15 ලබානොදීම නීත්‍යානුකූල බව නිරීක්ෂණය වේ.

එහෙත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 29/2019 චක්‍රලේඛයේ 7.2.1.1 ඡේදයේ වෙනත් පිළිගතහැකි ලේඛන සඳහා ලබාදෙනු ලබන ලකුණු 04 ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති නමුත් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද සිය පියාට අයත් ජල බිල්පත, විදුලි බිල්පත හා වරිපනම් බිල්පත සඳහා හිමිවිය යුතු 1.5ක ලකුණු ප්‍රමාණය අහිමිකර ඇති බව තහවුරු වේ. මේ සඳහා ලකුණු ලබාදීමේ හැකියාව පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සිදුකරන ලද විමසීමට පිළිතුරු ලබාදී ඇති අතිරේක ලේකම් (පාසල් කටයුතු) ගේ 2022.10.21 දිනැති ලිපියෙන් කොමිසම වෙත දන්වා ඇත්තේ, අදාළ ලකුණු ප්‍රමාණය පැමිණිලිකරු වෙත ලබාදිය හැකි බවයි.

ඊට අමතරව පළමු වසරට දරුවන් ඇතුළත් කරගැනීමේ චක්‍රලේඛනය 7.2.1.2 අනුව පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති අතිරේක ලේඛන සඳහා ලැබිය යුතු ලකුණු 05ද 7.2.2 අනුව පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්දහිමි නාම ලේඛනයේ ලියාපදිංචිය සඳහා හිමිවිය යුතු ලකුණු 25 ද 7.2.4 අනුව පදිංචි ස්ථානයේ සිට පාසලට ආසන්නතාව සඳහා ලබාදෙනු ලබන ලකුණු 25ද සමග පැමිණිලිකරුට මුළු ලකුණු 81.5ක් ලැබීමට නීත්‍යානුකූල හිමිකමක් ඇති බව තහවුරු වේ.

2022 වර්ෂයේ ධර්මරාජ විද්‍යාලයේ පළමු වසරට දරුවන් තෝරා ගැනීමේදී ආසන්න පදිංචිය යටතේ අවම ලකුණු ප්‍රමාණය ලකුණු 74ක් බැවින්, පැමිණිලිකරුට නීත්‍යානුකූලව ලකුණු 81.5 ක් ලබාගැනීමට හැකියාව තිබියදී පැමිණිලිකරුට කිසිදු ලකුණක් ලබානොදීම මගින් ධර්මරාජ විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැමිණිලිකරුට අගතිදායක ලෙස කටයුතු කර ඇති බව තහවුරු වේ.

පැමිණිලිකරු පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඔහුගේ පියාට අයත් ප්‍රකාශන ඔප්පුව වසර 10 කට වඩා අඩු බැවින්, එය ප්‍රතික්ෂේප කර පැමිණිලිකරුට ලකුණු ලබාගැනීමට හිමිකම් පවතින සෙසු කොටස් සඳහාද ලකුණු ලබානොදීම පැමිණිලිකරුගේ දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ පළමු වසරට දරුවා ඇතුළත් කරගැනීමට තිබූ අවස්ථාව අහිමිකිරීමක් බව තහවුරු වේ.

**නිගමනය :-**

මෙම කරුණු අනුව, වගඋත්තර පාර්ශවීය මහනුවර ධර්මරාජ විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අදාළ චක්‍රලේඛනයට පටහැනිව කටයුතු කර පැමිණිලිකරුට ලබාදිය හැකි ලකුණු ලබානොදීමෙන් පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) වන ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති නීතිය ඉදිරියේ සමාන ලෙස සැළකිලි ලැබීමේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) වන ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වීම මත, පැමිණිලිකරුගේ දරුවා (RS-46) 2022 වර්ෂයේ පළමු වසර සඳහා මහනුවර ධර්මරාජ විද්‍යාලයට

ඇතුළත් කිරීමට අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් කටයුතු කලයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසැල්)
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/